# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව

2017

# தேசிய கல்வி ஆணைக்குழு

## வருடாந்த அறிக்கை

2017

# National Education Commission

## Annual Report

2017

නො. 126, නාවල පාර, නුගේගොඩ - 126 எனும், முகவரியில் அமைந்துள்ளது - No.126, Nawala Road, Nugegoda

| පටුන | අංකය |
| --- | --- |
| 1. හැඳින්වීම | 02 |
| 2. කාර්යයන් හා කර්තව්‍යයන් | 04 |
| 3. කොමිෂන් සභාවේ සංයුතිය | 05 |
| 4. ඉලක්ක හා කාර්ය සාධන දර්ශක | 06 |
| 5. කාර්ය සාධන සාරාංශය - 2017 | 07 |
| 6. අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2017 | 15 |
| 7. ඇමුණුම් | |
| ඇමුණුම I - ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2017 | 16 |
| ඇමුණුම II - විසර්ජන ගිණුම - 2017 | 17 |
| ඇමුණුම III - කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු | 18 |
| ඇමුණුම IV - විගණකාධිපති වාර්තාව - 2017 | 20 |
| ඇමුණුම V - ආයතනික ව්‍යුහය | 28 |

## හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේ දී අධ්‍යාපනයේ පරමාර්ථ හා නිෂ්ධාවන් ඉටු කර ගැනීම සඳහා අධ්‍යාපන ක්‍රමයේ ව්‍යුහය, අධ්‍යාපන ආයතන වල පිහිටීම සහ ඒවායේ ව්‍යාප්තිය, ඒවායේ විනය පාලනය සහ වෘත්තිය වර්ධනය, ප්‍රජා සහභාගිත්වය උපයෝගි කර ගැනීමද ඇතුළුව අධ්‍යාපනය සඳහා අවශ්‍ය සම්පත් හා උපකාරක සේවා  යනාදිය ද සැලකිල්ලට ගැනේ.

මෙහි පළමුවන කොමිෂන් සභාව 1991-1996 කාලපරිච්ඡේදය සඳහා පත් කරනු ලැබීය. දෙවන කොමිෂන් සභාව 1996 ඔක්තෝම්බර් 01 වන දින සිට 2001 සැප්තැම්බර් අවසන් වන තෙක් ක්‍රියාත්මක විය. තෙවන කොමිෂන් සභාව 2001 ඔක්තෝම්බර් 01 දින සිට 2004 මැයි 30 දක්වා ක්‍රියාත්මක විය. හතරවන කොමිෂන් සභාව 2004 ජූලි 01 සිට 2006 මාර්තු වන තෙක් ක්‍රියාත්මක විය. පස්වන කොමිෂන් සභාව 2006 අප්‍රේල් 10 සිට සිය කටයුතු ආරම්භ කරන ලද අතර එහි නිල කාලය 2011 වර්ෂයේ අප්‍රේල් 09 දිනෙන් අවසන් විය. හයවන කොමිෂන් සභාව 2012 නොවැම්බර් 20 සිට 2017 අප්‍රේල් 28 දින දක්වා ක්‍රියාත්මක විය. 7වන කොමිෂන් සභාවේ සාමාජිකයින් 2017 සැප්තැම්බර් 7 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කර ඇති අතර එහි ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2017 ඔක්තෝම්බර් 19 වන දින පවත්වන ලදී.

**දැක්ම**

ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරක්ෂිත කෙරෙන්නාවූත් සියළු අභියෝගයන්ට මුහුණ දීම සඳහා යොදා ගත හැකි බව සහ සාධාරණත්වය සහතික කෙරෙන්නාවූත් පරිපූර්ණ අධ්‍යාපනයක් සැමට ලබාදෙන පෘථුල ජාතික ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම.

**මෙහෙවර**

අධ්‍යාපන පද්ධතියේ සියළු අංශ නොකඩවා පවත්වාගෙන යාම සහතික කෙරෙන්නාවූත් ශ්‍රී ලංකාවේ වෙනස් වන අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීමේ හැකියාව ඇත්තාවූත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## කාර්යයන් හා කර්තව්‍යයන්

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

## කොමිෂන් සභාවේ සංයුතිය:

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සමාජිකත්වය දරති.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, නුගේගොඩ, නාවල පාරේ අංක: 126 දරන ස්ථානයේ පිහිටා ඇත. ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන කටයුතු භාරව ක්‍රියා කරයි. දැනට කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 29 දෙනෙකුගෙන් සමන්විතය.

## ඉලක්ක හා කාර්ය සාධන දර්ශක - 2017

| ක්‍රියාකාරකම | | අරමුණු | කාර්ය සාධන දර්ශක |
|---|---|---|---|
| 01 | සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්තීන් පිළිබඳ පළාත්, කලාප හා කොට්ඨාශ අධ්‍යාපන නිලධාරීන්, ගුරු උපදේශකවරුන් සහ එම ක්ෂේත්‍රයට අදාළ වෙනත් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | සාමාන්‍ය අධ්‍යාපනයට අදාළව නව ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම. | අතිගරු ජනාධිපතිතුමා 2016 අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුමත කොට ප්‍රකාශයට පත් නොකළ හෙයින් ඉහත කී කාර්යය අවශ්‍ය නොවීය. |
| 02 | පළාත් අධ්‍යාපන බලධාරීන් සමග සම්බන්ධීකරණයෙන් පළාත් අධ්‍යාපන පද්ධතිය සමාලෝචනයට මුලපිරීම. | පළාත් අධ්‍යාපන පද්ධතිය සමාලෝචනය කිරීම. | ඒ ඒ පළාතට අදාළ වූ පළාත් අධ්‍යාපන පද්ධතිය සමාලෝචන වාර්තාව සැකසීම. |
| 03 | පළාත්වල ඉගෙනුම් ඵලයන්ගේ විෂමතාවයන් පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය (2016 සිට අඛණ්ඩව). | සාමාන්‍ය පෙළ ප්‍රතිඵලයන්ගේ පළාත් විෂමතාවයන් සඳහා බලපා ඇති සාධකයන් හඳුනාගැනීම | නිර්දේශයන් සහිත අවසන් වාර්තාව සකස් කිරීම. |
| 04 | 3 වන වර්ගයේ ඉතා දුෂ්කර පාසල්වල ගුණාත්මක සංවර්ධනය සඳහා උපායන් හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය කිරීම. | 3 වන වර්ගයේ ඉතා දුෂ්කර පාසල්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අදාළ උපාය මාර්ග හඳුනා ගැනීම | නිර්දේශයන් සහිත අවසන් වාර්තාව සකස් කිරීම. |
| 05 | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට අදාළව ප්‍රතිපෝෂණ හා අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම. | සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම සඳහා දායක වීම | ප්‍රතිපෝෂණ හා අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම. |
| 06 | උසස් අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සකස් කිරීම සඳහා මුලපිරීම. | උසස් අධ්‍යාපනයට අදාළ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සඳහා දායකවීම. | අවස්ථානුකූල විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම. |
| 07 | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම (2014 සිට අඛණ්ඩව) | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සඳහා දායකත්වය සැපයීම. | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් (භාෂා මාධ්‍ය 03 න්ම) සැකසීම. |
| 08 | තාක්ෂණික හා වෘත්තීය පුහුණු පාඨමාලාවල වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය (2016 සිට ඉදිරියට) | තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනයන්වල කාර්යයන්ගේ වර්තමාන තත්ත්වය පිළබඳ සමාලෝචනය කිරීම. | නිර්දේශයන් සමග අවසන් වාර්තාව සැකසීම. |
| 09 | කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | මානව සම්පත් සංවර්ධනය කිරීම තුළින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය සාධනය ඉහල නැංවීම. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම. |

## කාර්ය සාධන සාරාංශය - 2017

### හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත නෛතිකව පැවරී ඇති ප්‍රධාන කාර්ය භාරය පහත සඳහන් පරිදි මූලික භූමිකා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

1. සැලසුම් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් දේශයේ අධ්‍යාපන ප්‍රතිපත්ති විවරණය
2. කාලීන අවශ්‍යතාවයන්ට අනුරූපී වන පරිදි පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා යාවත්කාලීන කිරීම.
3. උක්ත සමාලෝචන, විශ්ලේෂණ, විවරණ, යාවත්කාලීන කිරීම් ආදිය පදනම්ව දේශයට වඩා උචිත හා ප්‍රශස්ත අධ්‍යාපන ප්‍රතිපත්ති රාජ්‍ය නායකයා වෙත නිර්දේශ කිරීම.

උක්ත භූමිකාවන් සපුරාලීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුන යටතේ ස්ථාවර කමිටු 3ක් ස්ථාපනය කරනු ලැබ තිබේ.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
2. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව

එක් එක් ක්ෂේත්‍රයෙහි විශේෂඥ දැනුම සහිත ප්‍රවීණයන්, හසල අත්දැකීම් ඇති වෘත්තිකයන් සහ අදාළ ක්ෂේත්‍රයේ විවිධ කුසලතා ප්‍රකට කර ඇති පෞද්ගලික අංශයේ විද්වතුන් ප්‍රමුඛ ප්‍රධාන පාර්ශවකරුවන් 15-20 අතර සංඛ්‍යාවකින් මෙම ස්ථාවර කමිටු තුන සමන්විත වේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජිකයන්ගේ ද ඉහත දැක්වූ ස්ථාවර කමිටු සාමාජිකයන්ගේ ද විශේෂඥ දැනුම සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ දීර්ඝ කාලීන අත්දැකීම් ද උපයෝගී කරමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්හි කාර්ය සාධනය පහත සඳහන් පරිදි සාරාංශ ගත කළ හැකිය.

### 1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

සාමාන්‍ය අධ්‍යාපනය යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස පහත ව්‍යාපෘති (ක්‍රියාකාරකම්) පහක් (05) 2017 වාර්ෂික සැලැස්මට ඇතුලත් කර ඇත.

- සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන්.
- පළාත් මට්ටමේ අධ්‍යාපන පද්ධති සමාලෝචනය පිළිබඳ පළාත් බලධාරීන් සක්‍රිය කරවීම.
- ඉගෙනුම් සාධන විෂමතා කෙරෙහි බලපාන පළාත් මට්ටමේ සාධක හඳුනා ගැනීමේ අධ්‍යයනය.
- තුන් වන වර්ගයේ අති දුෂ්කර පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම.

- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

### 1.1 සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

2016 වර්ෂයේදී අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීමට නොහැකි වූ "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා" වාර්තාව 2017 ජනවාරි මස 26 දින අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීම සිදු කෙරිණි. මීට අමතරව 2017 මාර්තු 02 වන දින මෙම වාර්තාව ගරු අග්‍රාමාත්‍යතුමා වෙත භාර දීම ද සිදු කරන ලදී.

අනතුරුව, එම ප්‍රතිපත්ති යෝජනාවලිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලැබීමෙන් පසු සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කළද එම ක්‍රියාවලිය අපේක්ෂිත මට්ටමින් සිදු නොවීම නිසා මෙම ක්‍රියාකාරකම 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කළ නොහැකි විය.

මීට අමතරව, ශ්‍රී ලංකා ඉතිහාස සංගමය විසින් අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත කරන ලද ලිඛිත ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, ජාතික අධ්‍යාපන ආයතනයේ විශේෂඥ කණ්ඩායමක් සහ ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් ඉතිහාසය විෂයය පිළිබඳ වැඩමුළුවක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 8 වන දින පවත්වන ලදි.

නව කොමිෂන් සභාව 2017 සැප්තැම්බර් මස පත් කිරීමෙන් පසු 2017 වර්ෂය අවසන් වනවිට සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම් වාර 2ක් පැවැත්වීමට හැකිවිය.

### 1.2 පළාත් මට්ටමේ අධ්‍යාපන පද්ධති සමාලෝචනය පිළිබඳ පළාත් බලධාරීන් සක්‍රිය කරවීම

2017 මුල් කාර්තුවේ දී දකුණ, වයඹ, නැගෙනහිර, උතුරු මැද, ඌව යන පළාත්වල අධ්‍යාපන පද්ධති සමාලෝචනය කිරීමට අදාළ ක්‍රියාත්මක සැලැසුම් (Action Plans) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ලැබුණි. ඒ අනුව, ඒ ඒ පළාත්වල අධ්‍යාපන බලධාරීන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කිරීම, පළාත් සම්බන්ධීකරණය කිරීම හා කටයුතු සමාලෝචනය කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රධානත්වයෙන් 2017.03.30, 2017.04.21 සහ 2017.10.17 යන දිනයන්හි දී පළාත් අධ්‍යාපන ලේකම්වරු, පළාත් අධ්‍යාපන සැලසුම් අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදි. ඒ අනුව, නැගෙනහිර පළාත හැර අනෙකුත් පළාත් විසින් අදාළ ව්‍යාපෘති යෝජනා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම දුෂ්කර බව පළාත් බලධාරීන් විසින් දැන්වූ අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන මුදල් කොමිෂන් සභාව විසින් ලබාදීම අපහසු බැවින් ඒ ඒ පළාත් සභාවල අධ්‍යාපන විෂයට වෙන් කර ඇති ප්‍රතිපාදන යොදාගෙන අදාල කාර්යය සිදු කළ යුතු බවට තීරණය කරන ලදී.

### 1.3 ඉගෙනුම් සාධන විෂමතා කෙරෙහි බලපාන පළාත් මට්ටමේ සාධක හඳුනා ගැනීමේ අධ්‍යයනය

2016 වර්ෂයේදී දෙමළ මාධ්‍ය දත්ත පරිවර්තනය කිරීමේ ප්‍රමාදය නිසා නිම කළ නොහැකි වූ මෙම ක්‍රියාකාරකම 2017 වර්ෂයේ වාර්ෂික සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කරන ලදී.

2017 වර්ෂයේ මුල් කාර්තුවේ දී දෙමළ මාධ්‍ය දත්තයන් සිංහල භාෂාවට පරිවර්තනය නිම වූ අතර එම දත්ත විශ්ලේෂණය කිරීම අගෝස්තු මස අවසන් වනවිට නිම විය. කෙටුම්පත් වාර්තාව 2017 සැප්තැම්බර් මස සකස් කළ අතර අවසන් වාර්තාව වර්ෂය අවසානයේදී නිම කරන ලදි.

### 1.4 තුන් වන වර්ගයේ අති දුෂ්කර පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම.

2016 වර්ෂයේදී දෙමළ මාධ්‍ය දත්ත පරිවර්තනය කිරීමේ ප්‍රමාදය නිසා නිම කළ නොහැකි වූ මෙම ක්‍රියාකාරකම 2017 වර්ෂයේ වාර්ෂික සැලැස්මට ඇතුලත් කිරීමට සිදුවිය.

2017 වර්ෂයේ මුල් කාර්තුවේ දී දෙමළ මාධ්‍ය දත්තයන් සිංහල භාෂාවට පරිවර්තනය නිම වූ අතර එම දත්ත විශ්ලේෂණය කිරීම අගෝස්තු මස නිමා වනවිට අවසන් විය. කෙටුම්පත් වාර්තාව 2017 සැප්තැම්බර් මස නිම කළ හැකි වූ අතර අවසන් වාර්තාව වර්ෂය අවසානයේ දී සකස් කරන ලදි.

### 1.5 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

“ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා” වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත 2017 වර්ෂයේ මුල් භාගයේදී පිළිගන්වන ලද අතර එය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් නොවූ බැවින් අපේක්ෂිත පරිදි ඉහත කාර්ය ක්‍රියාත්මක නොවිය.

## 2. උසස් අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

උසස් අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය යටතේ පහත ව්‍යාපෘතිය (ක්‍රියාකාරකම්) ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වාර්ෂික සැලැස්මට ඇතුලත් කර ඇත.

### 2.1 විශ්වවිද්‍යාල අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය.

මෙම ක්‍රියාකාරකම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස 2017 වර්ෂයේ මුල් කාර්තුවේ පළමු භාගයේ දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව අදාළ දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ දෙවන කාර්තුව අග භාගයේ දී නිර්දේශ කෙරුණු අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම 2018 වර්ෂයේ අයවැය සඳහා ඉදිරිපත් කෙරිණි.

එහි මූලික පියවරක් ලෙස ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීම උදෙසා වර්තමාන විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා සැලසුම්වල සිදුකළ යුතු වෙනස්කම් සහ නව

ප්‍රතිපත්ති හා යෝජනා පිළිබඳව මහජන අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ (www.nec.gov.lk) 2017 ඔක්තෝබර් මස 11වන දින පළ කරන ලදී. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කණ්ඩායමක් 2017 දෙසැම්බර් මස ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය වෙත ගොස් මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයීය ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සිදු කරන ලදි.

## 3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා ව්‍යාපෘති (ක්‍රියාකාරකම්) දෙකක් (02) 2017 වාර්ෂික සැලැස්මට ඇතුලත් කර ඇත.

### 3.1 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සම්පාදනය

2017 මුල් කාර්තුවේ දී අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා සම්පත් දායකයින් 21 දෙනෙකු සමග සාකච්ඡා පවත්වන ලදී. 2017 වර්ෂයේ අප්‍රේල් මස 28 වන දින 6 වන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව නියමිත කාලය අවසන් වීම හේතුවෙන් විසුරුවා හැරීමත් සමග තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක නොවිය.

2017 සැප්තැම්බර් මස 07 වන දින පත්වූ 7 වන කොමිෂන් සභාව මගින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම 2018 වර්ෂය තෙක් කල් දැමීමට තීරණය කරන ලදි. එහි මූලික පියවරක් ලෙස 2017 නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීම උදෙසා වර්තමාන කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා සැලසුම්වල සිදුකළ යුතු වෙනස්කම් සහ නව ප්‍රතිපත්ති හා යෝජනා පිළිබඳව මහජන අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ (www.nec.gov.lk) දැන්වීමක් පළ කරන ලද අතර 2017.12.12 දින ක්ෂේත්‍රයේ ප්‍රවීණයින්ගේ සහභාගීත්වයෙන් බුද්ධි කලම්බන වැඩමුළුවක් පවත්වන ලදි.

### 3.2 තාක්ෂණික හා වෘත්තීය පුහුණු පාඨමාලාවල වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය

2016 වර්ෂයේදී දෙමළ මාධ්‍ය දත්ත පරිවර්තනය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් නිම කළ නොහැකි වූ මෙම ක්‍රියාකාරකම 2017 වර්ෂයේ වාර්ෂික සැලැස්මට ඇතුලත් කිරීමට පියවර ගන්නා ලදී.

2017 වර්ෂයේ මුල් කාර්තුවේ දී දෙමළ මාධ්‍ය දත්තයන් සිංහල මාධ්‍යයට පරිවර්තනය නිම වූ අතර එම දත්ත විශ්ලේෂණය කිරීම අගෝස්තු මස අවසන් වනවිට සිදුකර අවසන් විය. කෙටුම්පත් වාර්තාව 2017 සැප්තැම්බර් මස සකස් කළ අතර අවසන් වාර්තාව වර්ෂය අවසානයේදී නිම කරන ලදි.

නව කොමිෂන් සභාව 2017 සැප්තැම්බර් මස පත් කිරීමෙන් පසු 2017 වර්ෂය තුළදී ස්ථාවර කමිටු රැස්වීම් වාර දෙකක් පැවැත්වීමට හැකිවිය.

## 4. ජනාධිපති ලේකම් කාර්යාලය වෙත සම්පාදනය කෙරුනු වාර්තා.

ඉහත දැක්වූ කාර්ය භාරයට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලය හා අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙතින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් විශේෂයෙන් අධ්‍යයනය කර වාර්තා කල යුතු අධ්‍යාපන ප්‍රතිපත්ති හා ඊට අදාළ කාර්යයන් වරින් වර පැවරිණි.

2016 අවසන් වනවිට සංස්කරණය කරමින් තිබූ සිංහල අක්ෂර ලේඛණය හා භාෂා ප්‍රයෝග විධි සම්බන්ධයෙන් වූ ප්‍රමිතිය පිළිබඳ කෙටුම්පත් වාර්තාව 2017 වර්ෂයේ නොවැම්බර් මස අවසන් වනවිට සිංහල භාෂාව පිළිබඳ විශේෂඥයෙකු මගින් සංස්කරණය කරන ලදුව වර්ෂය අවසානයේදී විද්වත් මණ්ඩලයක අධීක්ෂණය සඳහා යොමු කර ඇත.

2017.12.31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදිවේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 1 | 1 | _ |
| ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති නිලධාරී | 3 | 3 | _ |
| නියෝජ්‍ය ලේකම් / සහකාර ලේකම් | 1 | 1 | _ |
| ගණකාධිකාරී | 1 | _ | 1 |
| ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 4 | 2 | 2 |
| පරිපාලන නිලධාරී | 1 | 1 | _ |
| වැඩසටහන් නිලධාරී (මුදල්) | 1 | 1 | _ |
| වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | 4 | 1 | 3 |
| වැඩසටහන් නිලධාරී (තොරතුරු) | 1 | _ | 1 |
| සංවර්ධන නිලධාරීන් | 4 | _ | 4 |
| කළමනාකරණ සහකාර | 10 | 7 | 3 |
| රියදුරු | 6 | 6 | _ |
| ආරක්ෂක නියාමක | 2 | 2 | _ |
| කාර්යාල සහයක | 4 | 4 | _ |
| **මුළු** | **43** | **29** | **14** |

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | |
|---|---|---|
| අතිරේක ලේකම් | 2 | බඳවාගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබාගත යුතුය. |
| **එකතුව** | **2** | |

**මානව සම්පත් සංවර්ධනය**

ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ හා සමීක්ෂණ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය වන බැවින් එම කාර්යයන් සඳහා නිපුණතාවයෙන් හෙබි කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වේ. ඒ සඳහා පවත්නා සීමිත පුරප්පාඩු සියල්ල පිරවීමට ද මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ඊට අමතරව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා සුදුසු රැකියා විස්තර සම්පාදනය ද මේ වන විට සිදු කරමින් තිබේ.

මානව සම්පත් සංවර්ධනය සඳහා සකස් කරන ලද සැලැස්මකට අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා හඳුනාගත් අවශ්‍යතාවයන් අනුව ධාරිතා සංවර්ධනය/පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම අත්‍යවශ්‍යවේ.

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය / පුහුණුව පිළිබඳ තොරතුරු - 2017**

| | වැඩසටහනෙහි නම | සහභාගී වූ නිලධාරීන්ගේ නම | තනතුර | කාලය |
|---|---|---|---|---|
| 1. | Disciplinary Procedure at NILS | එස්.ඒ.ඩී. ද සිල්වා මහතා<br>ඩී.ඩී.සී. කලුබෝවිල මහතා<br>ආර්.ඒ. කරුණාරත්න මහතා | ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | දින 06<br>(2017 ජූලි 04,11,18,25,<br>2018 අගෝස්තු 01,08) |
| 2. | Procument Procedure for Executive officers at NILS | ආර්.ඒ. කරුණාරත්න මහතා | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | දින 03<br>(2017.09.07,14,21) |
| 3. | Project Management at SDFL | ආර්.ඒ. කරුණාරත්න මහතා<br>ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | දින 02<br>(2017.09.18,19) |
| 4. | Office Management and Financial Regulations | චම්පික ෆොන්සේකා මහතා<br>ජී.එල්. නිමේෂා මිය | පරිපාලන නිලධාරී<br>කළමනාකරණ සහකාර | දින 02<br>(2017.07.04,05) |
| 5. | Salary Preparation of Public Service | චම්පික ෆොන්සේකා මහතා<br>ජී.එල්. නිමේෂා මිය | පරිපාලන නිලධාරී<br>කළමනාකරණ සහකාර | දින 01<br>(2017.08.09) |
| 6. | Filing System at NILS | චම්පික ෆොන්සේකා මහතා | පරිපාලන නිලධාරී | දින 01<br>(2017.08.30) |
| 7. | Vehicle Fleet Management at Prag Institute | චම්පික ෆොන්සේකා මහතා | පරිපාලන නිලධාරී | දින 01<br>(2017.06.28) |
| 8. | Public Procument Procedure at NILS | චම්පික ෆොන්සේකා මහතා<br>ර්.එම්.වයි. සචිත් මහතා | පරිපාලන නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | දින 02<br>(2017.07.28,29) |
| 9. | Effective Handling of Personal File at NILS | චම්පික ෆොන්සේකා මහතා<br>ර්.ජී.අයි. ගමගේ මෙනවිය | පරිපාලන නිලධාරී<br>කළමනාකරණ සහකාර | දින 01<br>(2017.09.27) |
| 10. | Higher National Diploma in Public Procument and Contract Administration at SLIDA | ඩබ්.ඒ.ආර්.එන්. කුමාරසිංහ මිය | වැඩසටහන් නිලධාරී (මුදල්) | අවු.01 මාස 03 |
| 11. | Annual Stock Verification and Disposal of Unserviceable Items at NILS | ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය<br>ර්.ජී.අයි. ගමගේ මෙනවිය<br>එම්.ඒ.ඩී. ධනංජනී මිය | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | දින 01<br>(2017.09.26) |
| 12. | Administration of Machines and Vehicles at NILS | වයි.ආර්. හේවාසිලියනගේ මිය | කළමනාකරණ සහකාර | දින 02<br>(2017.03.28,29) |

| | | | | |
|---|---|---|---|---|
| 13. | Service Attached Training at SDFL | ඊ.ජී.අයි. ගමගේ මෙනවිය<br>එම්.ඒ.ඩී. ධනංජනී මිය | කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | දින 03<br>(2017.04.03,04,05) |
| 14. | Role and Responsibility of Leave Officer In Charge at NILS | එම්.ඒ.ඩී. ධනංජනී මිය | කළමනාකරණ සහකාර | දින 01<br>(2017.02.16) |
| 15. | Salary Conversion at SDFL | එම්.ඒ.ඩී. ධනංජනී මිය | කළමනාකරණ සහකාර | දින 02<br>(2017.06.15,16) |
| 16. | Acquisition and Management of Fixed Assets at NILs | ඇලෙක්ස් පිගරාඩෝ මහතා | කළමනාකරණ සහකාර | දින 01<br>(2017.08.16) |
| 17. | Responsibilities and Duties of Employees In Maintaining Discipline of an Organization at CETRAC | ඒ.වී.එස්.වී. පිගේරා මහතා | කාර්යාල කාර්ය සහයක | දින 01<br>(2017.07.25) |
| 18. | CIGAS Training Program at Ministry of Finance | එස්.එම්.ඒ. ද අල්විස් මහතා<br>එන්.පී.ජේ. හේවගේ මහතා<br>ආර්.ඒ. කරුණාරත්න මහතා<br>චම්පික ෆොන්සේකා මහතා<br>ඩබ්.ඒ.ආර්.එන්. කුමාරසිංහ මිය<br>ඊ.එම්.වයි. සචිත් මහතා<br>ඩබ්.ඩී.ඒ.කේ. දමයන්ති මිය<br>වයි.ආර්. හේවාසිලියනගේ මිය<br>එම්.ඒ.ඩී. ධනංජනී මිය<br>ජී.එල්. නිමේෂා මිය | නියෝජ්‍ය ලේකම්<br>ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>පරිපාලන නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (මුදල්)<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | දින 02<br>(2017.03.30,31) |

## අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2017

**Financial Progress Report as at 31st December 2017**

| Object Code | Description | Total Provision | Expenditure | Percentage of Expenditure % |
|---|---|---|---|---|
| | **Recurrent Expenditure** | **35,502,000** | **30,797,655** | **87** |
| | **Personal Emoluments** | **22,750,000** | **19,797,759** | **56** |
| 1001 | Salaries and Wages | 16,000,000 | 14,160,300 | 89 |
| 1002 | Overtime and Holiday Payments | 750,000 | 421,206 | 56 |
| 1003 | Other Allowances | 6,000,000 | 5,216,253 | 87 |
| | **Travelling Expenses** | **300,000** | **143,486** | **48** |
| 1101 | Domestic | 100,000 | 53,986 | 54 |
| 1102 | Foreign | 200,000 | 89,500 | 45 |
| | **Supplies** | **2,152,000** | **1,317,012** | **61** |
| 1201 | Stationery and Office Requisites | 302,000 | 211,381 | 70 |
| 1202 | Fuel | 1,600,000 | 920,798 | 58 |
| 1203 | Diets and Uniforms | 150,000 | 104,268 | 70 |
| 1205 | Other | 100,000 | 80,565 | 81 |
| | **Maintenance Expenditure** | **1,600,000** | **1,360,778** | **85** |
| 1301 | Vehicles | 1,000,000 | 940,068 | 94 |
| 1302 | Plant and Machinery | 500,000 | 400,532 | 80 |
| 1303 | Buildings and Structures | 100,000 | 20,178 | 20 |
| | **Services** | **8,700,000** | **8,178,620** | **94** |
| 1402 | Postal & Communication | 1,100,000 | 1,029,799 | 94 |
| 1403 | Electricity & Water | 1,000,000 | 769,882 | 77 |
| 1404 | Rents & Local Taxes | 5,000,000 | 4,800,000 | 96 |
| 1409 | Other | 1,600,000 | 1,578,939 | 99 |
| | | | | |
| | **Capital Expenditure** | **4,150,000** | **2,429,050** | **59** |
| | **Rehabilitation and Improvement of Capital Assets** | **50,000** | **0** | **0** |
| 2002 | Plant, Machinery & Equipment | 50,000 | 0 | **0** |
| | **Acquisition of Capital Assets** | **600,000** | **529,513** | **88** |
| 2102 | Furniture & Office Equipment | 500,000 | 436,003 | **87** |
| 2103 | Plant, Machinery & Equipment | 100,000 | 93,510 | **94** |
| | **Human Resource Development** | **1,000,000** | **736,159** | **74** |
| 2401 | Knowledge Enhancement & Institutional Development | 1,000,000 | 736,159 | **74** |
| | **Other Capital Expenditure** | **2,500,000** | **1,163,378** | **47** |
| 2507 | Research and Development | 2,500,000 | 1,163,378 | **47** |
| | **Total** | **39,652,000** | **33,226,705** | **84** |

ඇමුණුම I

## ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2017

| විස්තරය | ප්‍රමාණය | මිල (රු) |
|---|---|---|
| බ්‍රීෆ් කේස් | 3 | 20,550.00 |
| ඩේටා ට්‍රැවලර් | 4 | 9,000.00 |
| කාර්යාලීය පුටු | 14 | 96,278.00 |
| ලැප්ටොප් පරිගණක | 1 | 110,000.00 |
| යූ.පී.එස්. | 2 | 7,300.00 |
| වායු සමීකරණ යන්ත්‍ර | 1 | 93,510.00 |
| පරිගනක යන්ත්‍ර | 2 | 189,400.00 |
| රවුටර් | 1 | 3,475.00 |
| **එකතුව** | | **529,513.00** |

ඇමුණුම II

## විසර්ජන ගිණුම 2017

# විසර්ජන ගිණුම 2017

වියදම් ශීර්ෂ අංකය: 012 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පුනරාවර්තන | 35,502,000 | -- | -- | 35,502,000 | 30,797,655 | 4,704,345 | 3 |
| | උප එකතුව (පුනරාවර්තන) | **35,502,000** | -- | -- | **35,502,000** | **30,797,655** | **4,704,345** | |
| 1 | මූලධන | 4,150,000 | -- | -- | 4,150,000 | 2,429,050 | 1,720,950 | 4 |
| | උප එකතුව (මූලධන) | **4,150,000** | -- | -- | **4,150,000** | **2,429,050** | **1,720,950** | |
| | මුළු එකතුව | **39,652,000** | -- | -- | **39,652,000** | **33,226,705** | **6,425,295** | |

පිටු අංක 02 සිට 16 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වු ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 17 සිට 20 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/03/18

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2018/3/28

මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

එච්. නිලක්ෂි එන්. ගුණසේකර
ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අංක. 126, නාවල පාර
නුගේගොඩ.

1

ඩබ්. ඒ. ආර්. එන්. කුමාරසිංහ
වැඩසටහන් නිලධාරි (මුදල්)
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

ඇමුණුම III

## කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ තොරතුරු

### 6 වන කොමිෂන් සභාව

**හයවන කොමිෂන් සභාව** ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලද අතර 2017.04.28 වන දින එහි කාලසීමාව අවසන් වන ලදී.

**එහි සාමාජිකත්වය:**

**සභාපති** : මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා

**උප සභාපතිවරුන්:** ආචාර්ය ජයන්ති ගුණසේකර මිය (ප්‍රතිපත්ති/සැලසුම්) 2013.04.29 සිට 2016.03.16 දක්වා
ආචාර්ය සිවාන්දම් සිවසේගරම් මහතා (ප්‍රතිපත්ති) 2016.06.10 සිට 2017.04.28 දක්වා
මහාචාර්ය ඩී.එම්.ඒ. දිසානායක මහතා (සැලසුම්) 2016.11.02 සිට 2017.04.28 දක්වා

**නිල බලයෙන් පත්වන සාමාජිකයින් :**

| | |
|---|---|
| සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා |
| සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | මහාචාර්ය රජීව් විජේසිංහ මහතා |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | ඩබ්ලිව්. එම්. බන්දුසේන මහතා<br>සුනිල් හෙට්ටිආරච්චි මහතා |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත (අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව) | ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා |
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | එච්.ටී. කමල් පද්මසිරි මහතා |

**පත් කරන ලද සාමාජිකයින් :**

පූජ්‍ය අකුරටියේ නන්ද ස්වාමීන්වහන්සේ
කිංස්ලි ප්‍රනාන්දු මහතා
ආරියරත්න හේවගේ මහතා
පුෂ්පා කළුබෝවිල මිය
මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා
මහාචාර්ය එස්. සන්දරසේගරම් මහතා
ආචාර්ය හිරන්ති විජේමාන්න මිය
මහාචාර්ය දයන්ත විජේසේකර මහතා

**ලේකම් :** එච්.එන්.එන්. ගුණසේකර මිය

## 7 වන කොමිෂන් සභාව

**හත්වන කොමිෂන් සභාවේ** සභාපති, උප සභාපති ඇතුලු සාමාජිකයන් 2017.09.07 වන දින පත්ව ඇති අතර 2017 ඔක්තෝම්බර් මස19 වන දින ප්‍රථම කොමිෂන් සභා රැස්වීම පවත්වන ලදී.

**එහි සාමාජිකත්වය:**

**සභාපති** : මහාචාර්ය ඩබ්.අයි. සිරිවීර මහතා

**උප සභාපති** : ආචාර්ය ජී.බී. ගුණවර්ධන මහතා

**නිල බලයෙන් පත්වන සාමාජිකයින් :**

| | |
|---|---|
| සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා |
| සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | මහාචාර්ය රජීව විජේසිංහ මහතා |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත | මහාචාර්ය ආර්.යූ. හල්වතුර මහතා |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත (අතිරේක අධ්‍යාක්ෂ ජෙනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව) | ගීතා කේ. විමලවීර මෙනවිය |
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | එච්.ටී. කමල් පත්මසිරි මහතා |

**පත් කරන ලද සාමාජිකයින් :**

පූජ්‍ය අකුරටියේ නන්දනායක ස්වාමීන්වහන්සේ
මහාචාර්ය කේ. කන්දසාමි මහතා
මහාචාර්ය එම්.ඒ. නුහුමාන් මහතා
මහාචාර්ය ඩී.ඒ. තන්ත්‍රිගොඩ මහතා
ආචාර්ය එස්.බී. ඒකනායක මහතා
ආචාර්ය මල්ලිකා කරුණාරත්න මිය
වී.බී.පී.කේ. වීරසිංහ මිය

**ලේකම් :** එච්.එන්.එන්. ගුණසේකර මිය

ඇමුණුම IV

විගණකාධිපති වාර්තාව - 2017

999

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 12- ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරිම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 29 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

2

(99-b)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම. | 2.9 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.10 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.2.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වනු පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකිරීම. | 2.8 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම. | 2.3 |
| 127(5) | කොමිෂන් සභාවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නිලධාරීගේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.7 (ආ) |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේ නම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව | පාඩු හා හානි | 2.6 |

හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරි භාරයක් විම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කොමිෂන් සභාවේ රැස්වීම් හා ස්ථාවර කමිටු රැස්වීම් පැවැත්වීම

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ රැස්වීම් සහ ස්ථාවර කමිටුවල රැස්වීම් වාර 12 බැගින් රැස්වීම් වාර 24 ක් පැවැත්විය යුතු වුවද කොමිෂන් සභාවේ රැස්වීම් වාර 6 ක් හා ස්ථාවර කමිටු රැස්වීම් වාර 4 ක් පමණක් පවත්වා තිබුණි.

### 2.2 කාර්යසාධනය

#### 2.2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් ඉටු කිරීමට අපේක්ෂිත වූ ප්‍රධාන කාර්යභාරයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඒ, ඒ පළාත්වල අධ්‍යාපන පද්ධතිය සමාලෝචනය කිරීම සඳහා සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ රු.250,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ නමුත් එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 20 හා සියයට 50 ක් වී තිබුණි.

(ආ) ප්‍රතිපත්ති සම්පාදනය සඳහා භාවිතා වන අධ්‍යයනය යටතේ සිංහල අක්ෂර ලේඛනය හා භාෂා ප්‍රයෝග විධි පිළිබඳ ප්‍රමිතිය සඳහා රු.100,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම කාර්ය ඉටුකර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රතිපෝෂණ සහ මෙහෙයුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා කමිටු 9 ක් ස්ථාපිත කිරීම සඳහා රු.200,000 ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් සැලැසුම් කළ පරිදි එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඈ) සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා රු.800,000 ක ප්‍රතිපාදන ඇස්තමේන්තු කර තිබුණි. මේ යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබූ දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වා නොතිබුණි.

4

(99-C)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ) ඒ, ඒ පළාත්වල අධ්‍යාපන පද්ධතිය සමාලෝචනය කිරීම සඳහා රු.250,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. පළාත්වලට අදාළ සැලසුම් 3 ක් ලබාගෙන නොතිබුණු අතර කමිටු 8 ක් දැනුවත් කිරීමේ වැඩසටහන් 8 ක් සහ සමාලෝචන රැස්වීම් 1 ක් පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් රු 198,500 ක් ඉතිරි වී තිබුණි.

**2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම වාර්තා කොමිෂන් සභාව විසින් 2018 ජූලි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි

**2.4 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම/ චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් කොමිෂන් සභාව විසින් එම වාර්තා 2018 අගෝස්තු 10 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කොමිෂන් සභාව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි.

**2.6 පාඩු හා හානි**

වෑන් රථයක් අනතුරකට ලක්වීමෙන් පසු දරන ලද අළුත්වැඩියා වෙනුවෙන් වූ රු.787,256 වැයකර තිබූ අතර රක්ෂණය මඟින් රු.586,582 ක් ලැබී තිබුණි. ඉතිරි රු.200,674 කොමිෂන් සභාවේ වාහන නඩත්තු වියදම් ලෙස සලකා කටයුතු කර තිබුණි.

5

**2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ කොමිෂන් සභාවට සලසා තිබුණු මූලධන ප්‍රතිපාදනය, එහි උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 27.00 | 25.24 | 1.76 | 6.52 |
| | මූලධන | 4.05 | 2.62 | 1.43 | 35.31 |
| | **එකතුව** | **31.05** | **27.86** | **3.19** | **10.27** |
| 2014 | පුනරාවර්තන | 31.58 | 28.88 | 2.70 | 8.55 |
| | මූලධන | 5.45 | 3.97 | 1.48 | 27.16 |
| | **එකතුව** | **37.03** | **32.85** | **4.18** | **11.28** |
| 2015 | පුනරාවර්තන | 37.86 | 30.76 | 7.10 | 18.75 |
| | මූලධන | 6.20 | 1.63 | 4.57 | 73.71 |
| | **එකතුව** | **44.06** | **32.39** | **11.67** | **26.49** |
| 2016 | පුනරාවර්තන | 36.50 | 31.46 | 5.04 | 13.81 |
| | මූලධන | 4.65 | 2.18 | 2.47 | 53.12 |
| | **එකතුව** | **41.15** | **33.64** | **7.51** | **18.25** |
| 2017 | පුනරාවර්තන | 35.50 | 30.80 | 4.70 | 13.24 |
| | මූලධන | 4.15 | 2.43 | 1.72 | 41.45 |
| | **එකතුව** | **39.65** | **33.23** | **6.42** | **16.19** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 7 ක් සඳහා එකතුව රු.1,380,683 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු1,821,317 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 80 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

6

**2.8 අභ්‍යන්තර විගණනය**

කොමිෂන් සභාව ආරම්භක අවස්ථාවේ සිටම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**2.9 විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජූනි 9 දිනැති අංක ඩී.එම්.ඒ./2009(1) දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

**2.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂම් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 19.8 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වාර්ෂික වියදම රු. 682,681 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 07 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 03 | 08 |
| (iii) | ද්විතියික මට්ටම | 10 | 07 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | එකතුව | 45 | 29 | 16 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වූ අතිරේක ලේකම්, තනතුර අනුමත වී තිබුණද ඊට අදාළ බඳවාගැනීමේ පරිපාටිය මෙතෙක් අනුමත වී නොතිබීම මත බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වූ ගණකාධිකාරී තනතුර සහ තෘතිය මට්ටමේ තනතුරක් වූ සංවර්ධන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමත වී තිබූ නමුත් බඳවා ගැනීම් නිමකර නොතිබුණි.

(ඇ) **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීම අවශ්‍යවන අතර කොමිෂන් සභාව විසින් එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් මත කාර්යමණ්ඩල පුහුණුව සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු. 1,000,000 ක් වූ අතර එහි සත්‍ය වියදම රු. 736,159 ක් විය. අවම වශයෙන් වර්ෂයකට පැය 08 ක හෝ පුහුණුවක් නොලැබූ සංඛ්‍යාව 13 ක් විය.

(ii) පසුගිය වර්ෂ 5 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණු ප්‍රමාණය සැසඳීමේදී 2014 වර්ෂයේදී ප්‍රතිපාදනයෙන් සියයට 25 ක් වී තිබූ ඉතිරිවීම් 2016 වර්ෂයේ සියයට 72 දක්වා වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී සියයට 26 දක්වා පහත වැටී තිබූ බව නිරීක්ෂණය විය.

## 2.11 තිරසර සංවර්ධනය

(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

